# දෙවන වාර පරීක්ෂණය

## 7 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය 1 කොටස

## පැය 1

**1- 5** දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුරු තෝරන්න.

**01.** ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා .. මෙම පද්‍ය අයත් වන්නේ,

**1.** සිරිත් මල් දම

**2.** කාව්‍යශේඛරය

**3.** සුභාෂිතය

**02.** ක්ෂාන්තිවාදී තාපසතුමාට වධ බන්ධන පැමිණ වූ රජතුමා වන්නේ,

**1.** බ්‍රහ්මදත්ත රජතුමා

**2.** කළාබු රජතුමා

**3.** බිම්බිසාර රජතුමා

**03.** ඉවසීමෙන් ලැබෙන ආනිසංස කීයද?

**1. 5** යි

**2. 3** යි

**3. 7** යි

**04.** බුදු රජාණන්වහන්සේ ධර්ම සේනාධිපති තනතුර ලබා දුන්නේ,

**01.** ආනන්ද හිමි

**02.** මුගලන් හිමි

**03.** සැරියුත් හිමි

**05.** නායකත්ව ලක්ෂණයක් නොවන්නේ කුමක්ද?

**01.** ඉවසීම

**02.** විමසිලිමත් බව

**03.** අනුගාමිකයන්ට බිය වීම

**6-10** තෙක් ප්‍රකාශයන් හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (✖) ලකුණ ද යොදන්න.

**06.** අපණ්ණක ජාතක කතාවෙන් කළගුණ සැලකීමේ ගුණය ප්‍රකට වේ. (    )

**07.** සිගාලෝවාද සූත්‍රයේ ගුරු-සිසු සබඳතාව දැක්වෙන්නේ නැගෙනහිර දිශාවෙනි. (    )

**08.** ගුණ ජාතකයෙන් කළගුණ සැලකීම ගැන කතා කරයි. (      )

**09.** රෝග හට ගන්නා ක්‍රම 8ක් පිළිබඳ දේශනා කළේ ගිරිමානන්ද හිමියන්ටයි.(      )

**10.** අහිංසක අංගුලිමාල බවට පත් විය. (      )

**11 - 15** වන තෙක් නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

**11.** ගංගා, යමුනා, අචිරවතී, සරභූ ............................. පංචමහා ගංගාවන්ය.

**12.** නිත්‍ය ශීලය ගේහසිත ශීලය යනුවෙන් හඳුන්වන්නේ .................. ශීලයයි.

13. මෙරට පැරැන්නන් මත් වතුර පිළිකුල් කළ බව................. පවසා ඇත.

14. අන් අය ලවා වැරදි නොකිරීම ..................අයත් වේ.

15. බුදු රජාණන් වහන්සේ ............. ගුරු තනතුරේ තබා ගත්හ.

(ධර්මය,
මහී ,පංච ,රොබට් නොක්ස්,
විරතිය)

# 16 - 20 නිවැරැදි පිළිතුරු තෝරා යා කරන්න.

**A**

**16.** යුතුකම්.

**17.** නායකත්වය ලක්ෂණයකි.

**18** මංගල කරුණකි.

**19.** බොදු සිරිතකි.

**20.** වැඩිහිටියන්ට සැලකීම.

**B**

**a.** කළගුණ සැලකීම.

**b.** වෘද්ධාපචායනය.

**c.** සිගාලෝවාද සූත්‍රය.

**d.** නිවැරැදිබව.

**e.** ඉවසීම.

# දෙවන වාර පරීක්ෂණය

# 7 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය - 11

# පැය 1

පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

**(01.)**

**(i)** විරතිය හා සමාදනය යන වචන දෙකේ තේරුම් ලියන්න.

**(ii)** පිළිතුරු පංච ශීලය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

**(iii)** සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කාටද?

**(iv)** බුදුරදුන් තුළ ඉවසීම පැවති බවට උදාහරණ දෙකක් ලියන්න.

(v)විදේශීය ආක්‍රමණවලදී ඒවාට විසඳුම් සෙවීමට නායකත්වය ගත් ස්වාමීන් වහන්සේලා දෙදනෙක් නම් කරන්න.

(vi)පස්වග මහනුන් රහත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් ද?

(vii)බුදුරදුන් පිහිට වූ අසරණයන් දෙදෙනෙක් නම් කරන්න.

(viii)උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

(ix) දේවාචික උපාසකවරු නම් කරන්න.

(x) බුදුගුණාලංකාරය රචනා කළේ කවුද?

(ලකුණු 2 × 10 = 20)

**(02.)**

1. සිරිත් මල්දම කතුවරයා නම් කරන්න.

(ලකුණු 2)

2. පාසලේදී අනුගමනය කරන සිරිත් තුනක් ලියන්න.

(ලකුණු 3)

3. සිරිත් විරිත් අනුගමනය කිරීමෙන් පාසල් ශිෂ්‍යයෙකුට ඇති ප්‍රයෝජන 05ක් ලියන්න.

(ලකුණු 5)

**(03.)**

**1.** භාවනා කරන ක්‍රම දෙක නම් කරන්න.

(ලකුණු **2**)

**2.** තුන් සුත්‍රය ලියන්න.

(ලකුණු **3**)

**3.** මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග **05**ක් ලියන්න.

(ලකුණු **5**)

(04.)

1.බුදු සිරිතේ අග්‍ර දයකයා හා අග්‍ර දයිකාව නම් කරන්න.

(ලකුණු 2)

2.ධනංජය සිටුතුමා විවාහයට පෙර දියණියට ලබා දුන් අවවාද 03ක් ලියන්න.

(ලකුණු 3)

3. අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 05ක් ලියන්න. (ලකුණු 5)

(05.)

1. සීලයේ ප්‍රභේද දෙකක් නම් කරන්න.

(ලකුණු 2)

2. ආජීව අෂ්ටමක ශීලයේ ශික්ෂා පද 03ක් ලියන්න.

(ලකුණු 3)

3. පන්සිල් ආරක්ෂා කිරීමෙන් අපට ඇති ප්‍රයෝජන 05ක් ලියන්න.

(ලකුණු 05)

(06.)

1.බොදු සිරිත් දෙකක් ලියන්න .

(ලකුණු 2)

2.වැඩිහිටියන්ට සැලකීම ගැන කියවෙන ජාතක කතා 03ක් ලියන්න .

(ලකුණු 3)

3. භික්ෂූන් වහන්සේගෙන් ඉටුවන සේවාවන් 05ක් ලියන්න .

(ලකුණු 5)

(07.)

පහත සදහන් මාතෘකා අතුරින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

1.පන්සිල්

2.විශාඛා සිටු දියණිය

3.අසරණායන්ට පිහිට වීම

4.සිරිත් විරිත්

(ලකුණු 2 × 5 = 10)